**කොළඹ මහා නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම්**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 දෙසැම්බර් 30 දින නාගරික කොමසාරිස් වෙත යවන ලදී

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා අරමුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහා නගර සභාවකට ලැබෙන සියළුම මුදල් මහා නගර සභා අරමුදල නමින් හඳුන්වනු ලබන ගිණුමකට බැර කල යුතු වුවද විවිධ පරිත්‍යාගශිලීන්ගෙන් ලැබුණු රු.22,616,905 ක මුදලක් කොළඹ නගර සංවර්ධන අරමුදලට බැර කර නගර සංවර්ධන අරමුදල නමින් රු.23,552,838 ක් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කර තිබූ අතර එම ගනුදෙණු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොතිබුණි.

(ආ) අනුජීව රසායනාගාරය, ඝණ අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානය හා ගිනි නිවීමේ සේවා මධ්‍යස්ථානයන්හි තොග, අවසන් තොගයට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) ජල සැපයුම් හා මළ නාලිකා සංවර්ධන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ බාහිර ආයතන වලින් ලැබුණු රු.216,828,272 ක ප්‍රතිපාදන හා එම ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද රු.38,129,424 ක් වූ වියදම් ආපසු ගෙවිය යුතු තැන්පත් ගිණුමට හර හා බැර කර තිබීමෙන්, සභාව විසින් සපයන සේවාවට අදාල වියදම් සහ ඊට අදාල ආදායම් මූල්‍ය ප්‍රකාශන තුලින් නිරූපණය නොවුණි.

(ඈ) සභාවේ බැංකු ගිණුම් 03 කට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශවල වසර 04 ක සිට දැක්වෙන රු.10,967,601 ක් වූ ඍජු හර හා බැර කිරීම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි

(ඉ) ඉකුත් වර්ෂ වලදී ණයහිමියන් ලෙස හඳුනාගෙන විවිධ ණයහිමි ගිණුමට බැර කර තිබූ රු.1,100,493,421 ක් සමාලෝචිත වර්ෂයේදී, වෙන් වෙන්ව හඳුනාගෙන විවිධ ණය හිමි ගිණුමෙන් ඉවත් කර අධිකතා හා ඌණතා ගිණුමට බැර කර තිබුණද එම වටිනාකම තුල වූ ස්ථාවර වත්කම්, ණය හිමියන් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් හා ඊට අදාල උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.4,807,148 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එකී වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දීර්ඝ කාලයක සිට නිරවුල් නොවී පවතින ණයගැති ගිණුම් 7 ක රු.15,921,302 ක් වූ හර ශේෂ හා රු.2,140,747 ක බැර ශේෂයක් ද ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර මේ සඳහා වයස් විශ්ලේෂණයක්ද ඉදිරිපත් නොකෙරුණි.

(ආ) දේශීය ආදායම් බදු පනත යටතේ එකතු කරන ලද රු.15,647,557 ක බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු තැන්පත් ගිණුමෙහි දක්වා තිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් නිළධාරීන් වෙත ලබා දී ඇති සුළු මුදල් හා විශේෂ අත්තිකාරම් ගිණුම්වල නිරවුල් නොවූ රු.3,858,435 ක හර ශේෂයක් විය.

(ඈ) වයිට් පාර්ක් ඉඩම් විකිනීම පදනම් කර ගෙන විශ්‍රාමික නිළධාරීන් 04 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතුව තිබූ රු.221,676 ක් එම නිළධාරීන්ගේ විශ්‍රාම පරිතෝෂිතයෙන් අයකර ගත යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම ණය මුදල හා පොලිය අය කරගෙන නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**(අ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම.**

(i) එකතුව රු.10,442,194,520 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාල යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන සහ විශේෂ පංතියේ වෙළඳ ව්‍යාපාර සඳහා අවසන් වරට සිදු කරන ලද වරිපනම් තක්සේරු ගණනය කල ආකාරය දැක්වෙන තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ii) අනුජීව රසායනාගාරය සඳහා 2011,2012 හා 2013 වර්ෂයන්හි අධික මිල හා ධාරිතාවයෙන්යුත් රු.මි. 41.8 ක් වූ නවීන යන්ත්‍ර උපකරණ හා රු.මි. 4.4 ක් වූ සුළු මෙවලම් හා උපකරණ මිලදී ගැනීමේදි ඒවායේ උචිතභාවය හඳුනාගැනීමට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1. (ආ) පරිදි වෛද්‍ය පරීක්ෂණාගාර ක්ෂුද්‍ර ජීවින් පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය ලබා ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) සමාලෝචිත වර්ෂයට අදාල වටිනාකම රු.5,167,215 ක් වූ ගෙවීම් වවුචර් 34 ක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**(ආ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

2014 වර්ෂයේදී නිකුත් කරන ලද රු.4,991,542 ක ගනුදෙණු වලට අදාල විගණන විමසුමකට 2016 සැප්තැම්බර් 30 දින වන විටත් පිළිතුරු ලැබී නොතිබුණි.

**1.3.5 නීති රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**(අ) මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය)**

මහනගර සභා ආඥා පනතේ 254 අ (1) හා (2) අනුව සභාවට අයවිය යුතු යම් බද්දක්, දඩ මුදලක්, දන්ඩන මුදලක්, දඩුවම් වශයෙන් වූ ගෙවීමක්, ගාස්තුවක් හෝ වෙනත් ගෙවීමක් මහා නගර සභාවට අයවිය යුතුව තිබෙන අවස්ථාවක එම මුදල අයකර ගෙන එය මහා නගර සභාවේ අරමුදල් වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.3,616,054,624 ක් වූ හිග මුදල් අය කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි**

(i) මුදල් රෙගුලාසි 371 (2) (ආ) නියමය අනුව අතුරු අග්‍රිමයක් එක් අවස්ථාවකදී රු.20,000 ට නොවැඩි විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 13 කදී එකතුව රු.2,601,942 ක "තත්කාර්ය" අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) මාස 6 ට වැඩි අවුරුදු 12 කට අඩු කාලයක සිට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ එකතු වටිනාකම රු.19,840,669 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය**

(i) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තියට පටහැනිව අවුරුදු 01 සිට 03 දක්වා කාලයක් සඳහා තනතුරු 87 ක් වෙනුවෙන් අඛණ්ඩ වැඩ බැලීම් පත් වීම් 87 ක් ලබා දී තිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 3:1 වගන්තිය ප්‍රකාරව අතිකාල වැඩ සඳහා මුදල් වැයකල යුත්තේ අදාල කටයුත්ත ඉටුකිරීමට අන් කිසිම මාර්ගයක් නොමැති අතිවිශේෂ අවස්ථාවලදි වුවත් ඊට පටහැනිව එකම කාර්යයක් ඉටුකිරීමට 2011 වර්ෂයේ සිට 2013 පෙබරවාරි දක්වා රු.2,302,127 ක අතිකාල හා නිවාඩු දින වැටුප් සහ රු.13,588,617 ක දිරි දීමනාවක් අනුජීව රසායනාගාරයේ නිළධාරීන්ට හා සේවකයින්ට ගෙවා තිබුබව නියැදි පරීක්ෂාවේදි අනාවරණය විය.

**(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**

2007 ඔක්තොම්බර් 17 දිනැති අංක 09/2007 චක්‍රලේඛය ප්‍රකාරව මාස 12 කට හෝ ඊට වැඩි කාලයක් දැනටමත් නැවත සේවයේ යොදවා ඇති නිළධාරියෙකු එසේ සේවයේ යෙදවිය හැක්කේ කොන්ත්‍රාත් පදනම මත එකී කාලපරිඡේදය දක්වා පමණි. නමුත් අදාල ආයතනය විසින් කරනු ලබන ඉල්ලීමක් මත අවස්ථාචෝචිත පරිදි, එම තනතුරට අදාල පත් කිරීමේ / බලය පවරනු ලැබූ / පරිපාලන බළධාරියා විසින් එම පුරප්පාඩුව ස්ථිර සේවයේ සුදුසු නිළධාරියෙකුගෙන් නියමිත දිනයට පුරවාලිය නොහැකි බවට ලිඛිතව දන්වා එවා ඇති අවස්ථාවක හැරුනු කොට එකී නිළධාරියා යලිත් නැවත සේවයේ නොයෙදවිය යුතු වුවත් ඊට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත ඉඩම් නිළධාරි තනතුර සඳහා යෙදවූ විශ්‍රාමික නිළධාරියෙකුට සමාලෝචිත වර්ෂය තුල රු.969,382 ක් ගෙවීම් කර තිබුණි.

**(ඉ) නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛ**

1988 සැප්තැම්බර් 20 දිනැති අංක 08 දරන චක්‍රලේඛය නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් බැංකු ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර ගිණුමේ ප්‍රමාණවත් මුදලක් එකතුවූ විට පළාත් පාලන ආයතනය විසින් හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා ශක්‍යතා වාර්තාවක් සමඟ මුදල් ආපසු ලබා ගැනීම

සඳහා අනුමැතිය ලබාගෙන සභාවට අවශ්‍ය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ හැකි බව දක්වා තිබුණද 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය නියෝජ්‍ය ව්‍යාපෘති ගිණුමේ රු.650,418,149 ක් වූ ශේෂය දීර්ඝ කාළයක සිට එකතු වෙමින් පැවති නමුත් චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ආදායමට වඩා වැඩි පුනරාවර්තන වියදම රු.569,949,762 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ අදායම රු.67,504,358 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ලැබීම් රු.2,739,745,422 ක් හා ප්‍රාග්ධන වියදම් රු.3,273,906,691 ක් වූ අතර සමස්ථ ඌණතාවය රු.1,104,111,031 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉකුත් වර්ෂයට වඩා පුනරාවර්ථන ආදායම රු.මි.278 කින් හා ප්‍රාග්ධන ලැබිම් රු.මි.1,765 කින් වැඩි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සභාවේ මුළු පුනරාවර්ථන වියදම රු.මිලියන 915 කින් වැඩි වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේෂව සමාලෝචිත වර්ෂය තුළ සේවක වැටුප් රු.මි.615 කින්, ජංගම මුල්‍ය වියදම් රු.මිලියන 39 කින්, ආධාර සහ දායකවීම් රු.මි.219 කින්, ආයතන හා වෙනත් වියදම් රු.මිලියන 94 කින්, හා ප්‍රග්ධන මුල්‍ය ගාස්තු රු.මි.17 කින් ඉහළ යාම වියදම් වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මුල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සමස්ථ පුනරාවර්ථන ආදායම් වැඩි වීම් වලින් සියයට 79 ක් රජයේ ආධාර, වෙනත් ආධාර සහ ප්‍රතිපූර්ණය කර ගැනීම් විය.

(ආ) වරිපනම් හා බදු රු.මි.108.6 කින් හා කුලී ආදායම් රු.මි.61 කින් ඉකුත් වර්ෂයට වඩා වැඩි වී තිබුණු අතර ගාස්තු සහ දඩ මුදල් අය කිරීම් හා පොලී ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් රු.මි.93 කින් සහ රු.මි.27 කින් අඩු වී තිබුණි.

(ඇ) ප්‍රාග්ධන ලැබීම් යටතට රු.මි.2136.7 ක් වූ මුද්දර බදු ආදායම් ලැබීම් රු.මි.479 ක ලෝක බැංකු ආධාර යටතේ වාහන හා යන්ත්‍ර උපකරණ ලැබීම් හා රු.මි.75 ක ජපන් ආධාර යටතේ ගිනි නිවන යන්ත්‍ර උපකරණ ලැබීම් ඇතුළත් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ආධාර සහ දායකවීම් ලෙස ස්වයං රැකියා නියුක්තිකයන්ට මහන යන්ත්‍ර ලබාදීම සඳහා රු.මි.44 ක් කාන්තා කටයුතු සඳහා රු.මි.162.2 ක වියදම් දැරීම හා 150 සංවත්සරයේ උත්සව වෙනුවෙන් රු.මි.126.9 ක වියදම් දැරීම, ඉකුත් වර්ෂයට වඩා ආධාර සහ දායක වීම් වියදම් සියයට 47.1 කින් ඉහළ යාමට බලපා තිබුණි.

(ඉ) ස්ථාවර බැංකු අයිරාව දිගින් දිගටම ඉහළ යාම හා තාවකාලික බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ බැංකු අයිරා පොලිය සියයට 114 කින් ඉහළ ගොස් තිබුණි.

(ඊ) ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගත් විදේශ ණය වෙනුවෙන් 2015 වර්ෂය තුළ ණය පොළී ගෙවීම් රු.මි 17 ක් විය.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලබේ.

(අ) සභාවේ සමස්ථ ජංගම වත්කම් රු.5,938,460,593 ක් වූ අතර ජංගම බැරකම් රු.6,306,588,757 ක් විය. ඒ අනුව රු.368,128,164 ක ඌන කාරක ප්‍රාග්ධනයක් නිරීක්ෂණය වන අතර සභාවේ මුළු ජංගම වත්කම් ප්‍රමාණයම උපලබ්ධි වුවද එම මුදලින් මුළු ජංගම බැරකම් ප්‍රමාණය පියවීමට තරම් ප්‍රමාණවත් අරමුදලක් ජනිත නොවන බව නිරීක්ෂණය කෙරේ.

(ආ) 2015 දෙසැම්බර් මාසයේ බැංකු ප්‍රකාශය අනුව සභාවේ ප්‍රධාන ගෙවීම් ගිණුමෙහි සමාලෝචිත වර්ෂය අවසානයේ බැංකු ශේෂය රු.1,231,049,775 ක අයිරාවක් විය.

(ඇ) ඇස්තමේන්තු කළ ආදායම් වර්ෂය තුළ අය නොවීම, පුරෝකථනය කළ වියදම් ඉක්මවීම හා පුරෝකථනය නොකළ වියදම් දැරීම හේතුවෙන් සභාවේ ගෙවීම් ප්‍රමාණය ඉහළ ගොස් තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය පුරාම සමස්තයක් ලෙස බැංකු අයිරා තත්ත්වයක් නිර්මාණය වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට සභාව සතු සියළුම ස්ථිර තැන්පත් සුරැකුම් ලෙස තබා රු.මි.1200 ක් දක්වා ස්ථාවර බැංකු අයිරාවක් සහ අවස්ථා 2 කදී රු.මි.350 ක තාවකාලික බැංකු අයිරා ලබා ගෙන තිබුණි. සමස්ථයක් ලෙස සභාවට අයවිය යුතු ආදායම එකතු කිරීම වෙනුවෙන් කාර්යක්ෂම වැඩපිළිවෙලක් ඇති කිරීම හා වියදම් කළමනාකරණය ගැටළු සහගත වීමෙන් 2011 දෙසැම්බර් 31 වන විට රු.742,900,572 ක්වූ බැංකු අයිරාව 2015 දෙසැම්බර් 31 වන විට රු.1,231,049,775 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වෙමින් පැවතින.

(ඈ) 2015 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ජංගම මූල්‍ය ගාස්තු ලෙස රු.මි.50 ක් ප්‍රතිපාදන කර රු.මි.70.5 ක් අයිරා පොලී ලෙස ගෙවා තිබීම නිසා ප්‍රතිපාදන ඉක්මවූ වියදම සියයට 41 ක් විය.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 ආදායම් ඇස්තමේන්තු

2015 ආදායම් ඇස්තමේන්තු සමඟ තත්‍ය ආදායම් සැසඳීමේදී 2015 දෙසැම්බර් 31 දිනට කිසිදු ආදායමක් අය කර නොතිබුණු ආදායම් විෂයයන් 05 ක් වෙනුවෙන් රු.මි.860.4 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. තවද, ආදායම් විෂයයන් 06 ක් සඳහා රු.මි.1296.7 ක ආදායමක් ඇස්තමේන්තු කර මින් රු.මි.57.7 ක තත්‍ය අයවීමක් තිබුණත් අය නොවීමේ ප්‍රතිශතය සියයට 94.3 සිට සියයට 100 ක ඉහළ පරාසයක් ගෙන තිබුණි. 2015 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී අධි තක්සේරුවක් කර තිබූ අතර මුදල් රෙගුලාසි 85 (1) (ඇ) අනුව හැකිතාක් තාත්විකව සහ නිවැරදිව තම ඇස්තමේන්තු පිළියෙල කිරීමට ආදායම් ගණන් දීමේ නිළධාරීන් උත්සාහ දැරිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.4.2 වරිපනම් බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් බදු ප්‍රමාණය රු.2,596,914,615 ක් විය. එම මුළු හිඟ වරිපනම් බදු ශේෂ අතරින් රුපියල් ලක්ෂ පහ ඉක්මවූ දේපල 647 ක් වූ අතර එහි හිඟ වරිපනම් බදු ප්‍රමාණය රු.1,302,259,439 ක් විය.මේ අතරින් හිඟ වරිපනම් බදු රු.ලක්ෂ දහය ඉක්මවූ දේපළ සංඛ්‍යාව 312 ක් විය. එහි වටිනාකම රු. 1,072,043,576 ක් විය. එය මුළු හිඟ බදු ප්‍රමාණයෙන් සියයට 41 ක් විය.

(ආ) සභා බල ප්‍රදේශය තුළ පැවති රජයේ දේපළ අතරින් දේපළ 188 ක 2015 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟය රු.528,420,822 ක්වූ අතර එම හිඟය මුළු හිඟයෙන් සියයට 17 ක් විය.

(ඈ) රු.ලක්ෂ 5 ට වඩා වැඩි හිඟ ශේෂයක් පවතින දේපළ අතරින් 2015 වර්ෂය තුළ කිසිදු වරිපනම් බදු මුදලක් අයනොවූ දේපළ 457 ක් නිරීක්ෂණය වූ අතර එහි මුළු හිඟ මුදල් ප්‍රමාණය රු.851,473,441 ක් විය.

(ඈ) 2011 වර්ෂය පදනම් වර්ෂය ලෙස සලකා එයට සාපේක්ෂව වසර 04 ක ආදායම් වැඩි වීම සලකා බැලීමේදී 2012 වර්ෂයේදී ආදායම සියයට 7.46 ක් පමණක් වැඩි වී තිබූ අතර 2015 වර්ෂය වන විට වැඩි වීම සියයට 3.97 ක් විය. එය 2012 වර්ෂයේ වැඩි වීම හා සැසඳීමේදී සියයට 4 ක ප්‍රමාණයකින් අඩු වී තිබුණි.

(ඉ) වසර 05 ක් තුල හිඟ වරිපනම් අයවීම ප්‍රතිශතයක් ලෙස සියයට 14.4 සිට සියයට 29.5 ක පරාසයක් දක්වා විහිදී තිබූ අතර හිඟ ආදායම් අයවීම දුර්වල මට්ටමක තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ආරම්භක හිගය රු. | හිගයෙන් අයවීම රු. | ප්‍රතිශතයන් % |
|---|---|---|---|
| 2011 | 2,603,060,920 | 424,213,088 | 16.29 |
| 2012 | 2,682,525,723 | 471,064,929 | 17.56 |
| 2013 | 2,758,579,237 | 397,259,160 | 14.40 |
| 2014 | 2,944,276,572 | 88,584,288 | 29.50 |
| 2015 | 2,515,636,643 | 451,710,814 | 17.95 |

(ඊ) මහා නගර සභා ආඥා පනතේ 230 (4) ඡේදයෙහි විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන හා නිවාස අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති 1988 පෙබරවාරි 19 දිනැති අංක 494 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව අදාල වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර හෝ එදින ගෙවන්නේ නම් සියයට 10 ක වට්ටමකට හා වාරික මගින් ගෙවනු ලබන්නේ නම් මුල් මාසය ඇතුලත සියයට 5 ක වට්ටමක් ලබාගැනීමට හිමිකමක් ලබා ගැනීමට ප්‍රතිපාදන සලසා ඇත.හිග ශේෂ පවතින දේපළ 130 ක් වෙනුවෙන් රු.5,913,000 ක් ලබාදී තිබූ බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ අතර නියමිත පරිදි වරිපනම් ගෙවන්නන් හා නොගෙවන්නන් සඳහා සමාන ලෙස වට්ටම් ලබා දීම මගින් නියමිත පරිදි වරිපනම් ගෙවන්නන් හට සෘණාත්මක බලපෑමක් සිදුවීම නොවැලක්විය හැකි බව නිරීක්ෂණය විය. සභාව තුල දැනට පවත්නා තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පද්ධතිය (AS400) තුළ තක්සේරුකරණය සම්බන්ධව විෂය කේෂත්‍රයක් අන්තර්ගත වී තිබුණද එම කේෂ්ත්‍රය යාවත්කාලීන කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(උ) තක්සේරු පිළිබඳ තොරතුරු පද්ධතියක් ඇති කිරීම සඳහා වාර්ෂික අයවැය ලේඛනය අනුව 2013 වර්ෂයේදී රු.මි.10 ක්ද 2014 වර්ෂයේදී රු.මි.7.2 ක්ද 2015 වර්ෂයේදී රු.මි.15.3 හා 2016 වර්ෂයේදී රු.මි.20 ක්ද වශයෙන් ප්‍රතිපාදන වෙන් කරමින් තිබූ නමුත් 2016 අගෝස්තු 03 වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු කාර්යය සාධනයක් ඇති වී නොතිබුණි.

### 2.4.3 උත්සව ශාලා කුලී මුදල්

නියැදි පරීක්ෂාවට අනුව මැගසින් පාර උත්සව ශාලාව වෙන් කිරීමේ ආකෘති පත්‍රයේ දක්වා තිබූ ගාස්තු චක්‍රය අනුව දිනකට කුලිය රු.5,000 ක් සහ තැන්පත් මුදල රු.5,000 ක් ද, වරුවකට (පැය 05 කට) රු.2,500 ක් සහ තැන්පත් මුදල රු.5,000 ක් ද, අමතර පැයකට රු.900 ක් සහ ගාස්තු සඳහා සියයට 15 ක එකතු කල අගය මත බදු අය කළ යුතු වුවද එයට පටහැනිව අවස්ථා 19 කදී ගාස්තු සඳහා රු.6,410 ක් හා තැන්පත් මුදල් සඳහා රු.53,500 ක් අඩුවෙන් අයකර තිබුණි.

## 2.4.4 නාගරික ව්‍යාපාරික ස්ථාන වල කුලී

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නාගරික ව්‍යාපාරික ස්ථාන 255 ක් කුලී පදනම මත ලබා දී තිබූ අතර ඉන් ආයතන 232 ක 2015 දෙසැම්බර් 31 දින වන විට මුළු හිග ආදායම රු.25,079,544 ක් විය. තවද වාරික තුනකට වඩා හිගව පැවති හිග වෙළඳසැල් ප්‍රමාණය බදු දී ඇති මුළු වෙළඳසැල් ප්‍රමාණයෙන් සියයට 59 ක ප්‍රමාණයක් විය.

(ආ) නාගරික ව්‍යාපාරික ස්ථාන කුලියට ලබා දීම මගින් වාර්ෂිකව අපේක්ෂිත ආදායම රු.25,000,000 ක් වු අතර 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත මුළු හිඟ ආදායම රු.25,079,544 ක් විය. එම මුළු හිඟ ආදායම මුළු ආදායමින් සියයට 84 දක්වා ඉහල ගොස් තිබුණි.

(ඇ) සාප්පු හා වෙළඳසැල් හිඟ බදු ප්‍රමාණය වාරික 03 සිට වාරික 200 දක්වා පරාසයක රු.23,807,139 ක්ද වාරික 200 ට වැඩි රු.786,939 ක් විය.

## 2.5 අධිභාර

--------

සභාව වෙත මවිසින් නිකුත් කර තිබූ අධිභාර සහතික 06 ක් වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.290,387 ක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

## 3.1 නාගරික අනුජීව රසායනාගාරයේ කාර්ය සාධනය

------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පවත්වාගෙන යන නාගරික අනුජීව රසායනාගාරයේ කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේ අය වැය මගින් රු.17,050,167 ක ආදායමක් සහ රු.84,626,632 ක වියදමක් අපේක්ෂා කර තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදි 2015 වර්ෂයේ අයකල පරීක්ෂණ ගාස්තු ආදායම සියයට 79 කින් අඩු වී තිබුණු අතර එය අපේක්ෂිත ආදායමින් සියයට 28 ක් වී තිබුණි. වියදමද වැඩි වී තිබුණු අතර ඉන් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ වියදම සියයට 83 කින් වැඩි වී තිබුණි.

(ආ) අනුජීව රසායනාගාරයේ පසුගිය ආසන්න වර්ෂ 05 ක මුදල් අයකර සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව හා අයකල ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ජල සාම්පල් සංඛ්‍යාව | ආහාර සාම්පල් සංඛ්‍යාව | වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව | මුළු පරීක්ෂණ සංඛ්‍යාව | අයකල ආදායම රු. |
|---|---|---|---|---|---|
| 2011 | 1303 | 1090 | 28602 | 30995 | 8,888,659 |
| 2012 | 1688 | 2785 | 51390 | 53863 | 16,900,507 |
| 2013 | 2136 | 1708 | 51381 | 55225 | 17,538,480 |
| 2014 | 1709 | 1448 | 39789 | 42946 | 22,707,810 |
| 2015 | 768 | 274 | 7352 | 8394 | 4,836,532 |

මුදල් අයකර සිදුකරන පරීක්ෂණ සංඛ්‍යාව 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩිවී 2014 වර්ෂයේ දී පෙර වර්ෂයට වඩා සියයට 22 ක අඩුවීමක්ද, 2015 වර්ෂයේදි සියයට 80 ක අඩු වීමක්ද, ඒ හා සමානව 2015 වර්ෂයේ ආදායම පෙර වර්ෂයට වඩා සියයට 79 ක අඩුවීමක්ද පෙන්නුම් කෙරේ.

(ඇ) 2011 ආහාර නියමයන්හි 11 අනුව ආහාර පරිහරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෑම තැනැත්තෙක්ම සේවයේ යෙදීමට පෙර ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් සුදුසු සෞඛ්‍ය තත්ත්වයෙන් සිටින බවට සහතික කල යුතුය. තවද නගරය තුළ ආහාර හා සම්බන්ධ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා වෙළඳ බලපත්‍රයන් වාර්ෂිකව ලබාගත යුතු අතර ඒ සඳහා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිගේ නිර්දේශය ලබාගත යුතුය. ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා අනුජීව රසායනාගාරයෙන් අදාල වෛද්‍ය පරීක්ෂණ කර ගැනීම සඳහා පෙළඹවීමක් ඇති කර ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) එකවර සැලකිය යුතු ආහාර සාම්පල් සංඛ්‍යාවක් පරීක්ෂා කිරීමේ ශක්‍යතාවයක් පවතින නවීන යන්ත්‍ර උපකරණ ප්‍රමාණයක් මිලදී ගැනීම හා ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා 2011 සිට 2015 දක්වා රු.62,857,231 ක් වැයකර තිබුණද ප්‍රමාණවත් ආහාර සාම්පල් පරීක්ෂා නොකිරීම හේතුවෙන් එම උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි.

(ඉ) රසායනාගාරයේ පරීක්ෂණ අඩුවීම හේතුකොට ගෙන ගබඩා කර තිබූ රසායනික ද්‍රව්‍ය තොගයේ අතිරික්තයක් තිබුණෙන් පොත් රසායනික ද්‍රව්‍යවල කල් ඉකුත් වීම හා කල්ඉකුත් වීමට ආසන්න වීම දක්නට ලැබුණි.

(ඊ) පුද්ගලික ආහාර හා ජල සාම්පල් විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීමට අදාලව සභාව වෙත අයකරනු ලබන මුදලින් සියයට 35 ක්, ඒ හා සම්බන්ධ රාජකාරිවල නියැලෙන නිළධාරීන්ට හා සේවකයන්ට සභා තීරණය පරිදි ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් 2011 සිට 2013 වර්ෂයන් සඳහා රු.4,767,983 ක් අනුමත කර තිබුණද එම අනුමැතිය ඉක්මවා 2011,2012 සහ 2013 පෙබරවාරි මස දක්වා නාගරික අනුජීව රසායනාගාරයේ නිළධාරීන්ට හා සේවකයින්ට දිරි දීමනා ලෙස රු.13,588,617 ක් ගෙවා තිබූ අතර අනුමැතිය ඉක්මවා ගෙවා ඇති මුදල රු.8,820,634 කි. එම පරීක්ෂණ සඳහා වැය කල ඍජු වියදම් අඩු නොකර දළ ආදායම් මත පදනම්ව දීමනා ගණනය කර ගෙවා තිබුණි.

(උ) අනුජීව රසායනාගාර ගබඩාවේ ඇති තොග සම්බන්ධයෙන් මු.රෙ. 756 (1) ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් මේ දක්වා කිසිදු අවස්ථාවක සිදුකර නොතිබුණි. තවද මෙම රසායනාගාරයට පසුගිය ආසන්න වර්ෂ 05 ක් තුල රු.මි.138 ක රසායනික ද්‍රව්‍ය ලබාදී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### 3.2.1 ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානයට උපකරණ මිලදි ගැනීම

කොච්චිකඩේ ප්‍රජා මණ්ඩලය තුල පවත්වාගෙන යන ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානය අති නවීන මධ්‍යස්ථානයක් බවට පත්කිරීමට සමාලෝචිත වර්ෂය තුලදී රු. 9,244,964 ක් වැයකර කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා උපකරණ මිලදී ගෙන තිබූ අතර මෙහිදී කායවර්ධන උපදේශක විසින් ඉල්ලා තිබූ කායවර්ධන උපකරණ වලට අමතරව රු.1,759,772 ක් වූ උපාංගද මිලදිගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වැඩිම මිල ඉදිරිපත් කර තිබුණු USA නිෂ්පාදනයක් වන රියල්ලීඩර් නිෂ්පාදන මිලදී ගත යුතු බවට වු තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය මත අයිතම් 52 ක් එම්පරර් ඩිස්ට්‍රිබියුටර්ස් වෙතින් මිලදී ගෙන තිබුණි.එහෙත් USA Real Leader වෙළඳ නාමය චීන රජයේ නිෂ්පාදනයක් බව විගණනයේදී අනාවරණය විය.

(ii) පිරිවිතරයන්ට අනුව Treadmill අශ්ව බල 05 ක ධාරිතාවයකින් යුක්ත විය යුතු වුවත් අශ්ව බල 03 ක ධාරිතාවයකින් යුතු රු.900,000 ක් වටිනා Treadmill 02 ක් ප්‍රජා මණ්ඩලයට ලැබී මාස 02 ක් ඇතුලත ක්‍රියා විරහිත වීම නිසා Acer වර්ගයේ Treadmill 02 ක් නැවත ලබා දී තිබුණි.

(iii) රු.4,070,368 ක් වටිනා කායවර්ධන උපකරණ 09 ක් ප්‍රජාමණ්ඩලයට ලබාදී තිබුණද ක්‍රීඩා හා විනෝදාංශ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2015 දෙසැම්බර් 04 දින විගණනය වෙත ලබාදුන් කායවර්ධන උපකරණ නිකුත්කිරීමේ වාර්තාවේ එම කායවර්ධන උපකරණ ඇතුලත්වී නොතිබුණි.

(iv) කොච්චිකඩේ කායවර්ධන මධ්‍යස්ථානය, සභා අනුමැතියකින් හා ගිවිසුම් ගත වීමකින් තොරව ක්‍රීඩා සමාජයකට ලබා දී එම ක්‍රීඩා සමාජයට මුදල් අය කිරීමට ඉඩ සලසා තිබුණි.

(v) ව්‍යායාම් උපකරණවල සුදුයකඩ කොටස් මළබැදි තිබූ අතර මිලදී ගැනීමේ ගිවිසුම අනුව අවශ්‍ය අවස්ථා වලදී සේවාව (Service) හා අළුත්වැඩියා කටයුතු සිදුකල යුතු බවට එකඟ වී තිබුණත් අදාල ආයතනය මාර්ගයෙන් ව්‍යායාම් උපකරණවල රැදී තිබුණු මළ ඉවත් කිරීම් සිදු කර ගෙන නොතිබුණි.

**3.2.2 කොළඹ 05 පාර්ක් ලේන් අංක 4 (2 1/2), නිළ නිවස**

කොළඹ මහා නගර සභාවෙ හිටපු ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියා විශ්‍රාම යාමෙන් පසු ඔහුගේ භාර්යාව වු රසායනාගාර සේවාවේ නියුතු වෛද්‍යවරියට නිල නිවස ලබාදී තිබූ අතර ආයතන සංග්‍රහයේ 19 වන පරිච්ඡේදයේ 5.4 වගන්තිය අනුව උපලේඛනගත නිවාසයක් ලබා ගැනීමට හිමිකමක් නොමැති මෙම නිළධාරිණියගේ වැටුපෙන් සියයට 12 1/2 ක කුලියක් අයකර යුතු වුවත් 2014 ජුනි මස සිට වැටුපෙන් සියයට 2 ½ ක කුලියක් අයකර තිබුණි. නියමිත පරිදි අයකර ගත යුතු මුළු මුදල රු.148,667 ක් වුවද අයකර තිබුනේ රු.29,733 ක් බැවින් තව දුරටත් අයකර ගත යුතු මුදල රු.118,934 ක් විය. අංක 4 නිළ නිවස මෙම නිළ නිවස සමඟ ඒකාබද්ධ කර තිබීම හේතුවෙන් උපලේඛනගත නිවාසයක් ලබා ගැනීමට හිමිකම ඇති නිළධාරියකුට නිළ නිවාස පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව අහිමිවි තිබුණු අතර එම අංක 4 නිළ නිවසෙන් ලැබිය යුතු කුලි ආදායමද අහිමි වී තිබුණි.

**3.2.3 වාහන මිලදී ගැනීම**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 පෙබරවාරි 19 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2015 හි 6:3 ඡේදය අනුව 2015 වර්ෂය තුල නව වාහන ආනයනය හෝ මිලදී ගැනිම අත්හිටුවා ඇති නමුත් සභාව විසින් වර්ෂය තුල රු.35,750,000 ක් වු වාහන මිලදී ගෙන තිබුණු අතර රු.13,000,000 ක් වු කැබ් රථ 02 ක් මිලදී ගැනීම සඳහා පමණක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන තිබුණි.

(ii) මහා නගර සහා ආඥා පනතේ 28 වගන්තිය අනුව, "මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව විසින් කලින් සලකා බලා මහා සභාවට වාර්තා කරන තෙක්, මහා නගර සභාවක් විසින් කිසිම මුදල් පිළිබඳ කරුණක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් ක්‍රියා නොකළ යුතු වුවද, ඊට පටහැනිව අවස්ථා දෙකකදී සභාවේ ආවරණ අනුමැතියට යටත්ව රු.22,750,000 ක් වටිනා වාහන මිලදී ගෙන තිබුණි.

### 3.2.4 සභික දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීම

සමාලෝචිත වර්ෂයේදි නගරාධිපති නියෝජ්‍ය නගරාධිපති හා නාගරික මන්ත්‍රීවරුන් 51 දෙනෙකු සඳහා සභික දීමනා රු.12,860,000 ක් ගෙවා තිබු නමුත් වර්ෂයට අදාලව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණේ රු.3,333,000 ක් පමණි. 2015 වර්ෂය සඳහා සභික දීමනා වැඩි වීම නොසලකා පැරණි අගයටම පලාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපර්ණය කර තිබු අතර නිවැරදි අගයට එම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. මේ අනුව 2015 වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර නොමැති සභික දීමනා මුදල රු.9,527,000 ක් වු අතර 2014 වර්ෂයේදී එය රු.2,650,000 ක් විය. තවද, මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමේදී මුදල් ලබාගත් බවට මන්ත්‍රීවරුන්ගෙන් අත්සන් ලබා ගැනීමට හා මුදල් ප්‍රතිපූර්ණයේ අයදුම් පත්‍ර පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමේදී ද සැලකිය යුතු ප්‍රමාදයක් දක්නට ලැබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 3.3.1 නාගරික මුද්‍රණාලය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) හයිඩ් පාර්ක්හි ඉදිකරන ලද නාගරික මුද්‍රණාල ගොඩනැගිල්ල හා ඒ තුළ ක්‍රියාත්මක වන යන්ත්‍ර වල නිසි ක්‍රියාකාරිත්වය සඳහා ඇම්පියර් 400 ක විදුලි ධාරිතාවක් අවශ්‍ය බව ගොඩනැගිල්ල සැලසුම් කල ඉදිකිරීම් සමාගම පෙන්වා දී තිබියදී එය නොසලකා සභාව විසින් මෙම ගොඩනැගිල්ල සඳහා ඇම්පියර් 60 ක විදුලි සම්බන්ධතාවයක් ලබා ගෙන තිබුණි. මුද්‍රණාලය සතු මුද්‍රණ යන්ත්‍ර සියල්ල ඇම්පියර් 60 ක ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් සභාවේ දෛනික කටයුතු වලට අවශ්‍ය ලියකියවිලිවල මුද්‍රණ කටයුතු මාස 01 සිට මාස 06 දක්වාද, විවිධ දෙපාර්තමේන්තු 04 කට හා අංශයන් 02 කට අදාල මුද්‍රණ කටයුතු වල ප්‍රමාදයන්ද සිදු වී තිබුණි.

(ii) 2014 වර්ෂයේදී රු.39,447,287 ක් වැය කොට නාගරික මුද්‍රණාලය සඳහා SM74-2 මාදිලියේ ද්වි වර්ණ ඔෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගෙන තිබුණි. මෙම යන්ත්‍රය මිලදී ගැනීමේදී, කොළඹ මහා නගර සභාවේ මුද්‍රණ කටයුතු වලට අමතරව පරිබාහිර ආයතන වල මුද්‍රණ කටයුතු සිදුකර දී මෙන් ආදායමක් ඉපයීමේ අරමුණක් ද සභාවට තිබු අතර 2016 මැයි 30 වන විට පරිබාහිර ආයතන 11 ක් විසින් මුද්‍රණ කටයුතු සඳහා මිල ගණන් කැඳවා තිබූ නමුත් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබීම හේතුවෙන් සභාවට උපයා ගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

### 3.3.2 කොළඹ මහා නගර සභාවේ 150 සංවත්සරය සඳහා පොත් මුද්‍රණය කිරීම.

මෙම සංවත්සරය වෙනුවෙන් Coffee Table Book පිටපත් 500 ක් මුද්‍රණය කිරීම සඳහා රු.4,520,000 ක් ගෙවා තිබුණි. මෙම ග්‍රන්ථය රු.15,000 ත් රු.20,000 ත් අතර මිලකට අලෙවි කල හැකි බවට මුදල් පිළිබඳව ස්ථාවර කමිටුවේ නිර්දේශය ලැබී තිබු නමුත්. 2016 මැයි 4 වන දින වන විට රු.10,000 ක් බැගින් පොත් 05 ක් පමණක් අලෙවි කර තිබු අතර පිරිවැය රු.1,826,080 ක් වු පොත් 202 ක් මහජන පුස්තකාල දෙපාර්තමේන්තුවේ ගබඩා කර තිබුණි.

### 3.3.3 වාහන කුලියට ගැනීම

---------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මීතොටමුල්ල කසල අංගනයට බුල්ඩෝසර් 03 ක් හා එක්ස්කැවේටර් 05 ක් සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට 2015 වර්ෂය තුලදී රු.168,722,961 ක් ගෙවා තිබුණි. වාර්ෂිකව සහා අරමුදලින් සැලකිය යුතු වියදමක් මේ සඳහා වැය වන බැවින් සභාව විසින්ම වාහන මිලදී ගෙන සේවයේ යෙද වූවේ නම්, මෙම වියදම අවම කරවා ගැනීමට හා වත්කම් සභාව සතුකර ගැනීමට හැකිව තිබුණි.

(ii) 2015 අප්‍රේල් 30 දිනැති අංක 2117 දරන සභා තීරණය පරිදි සභාව සතු නාගරික කර්මාන්ත ශාලාවේ ඇති බැකෝ ලෝඩරය අළුත්වැඩියා කර කසල අංගනයේ කටයුතු සඳහා යෙදවීමටත් ඉන් පසු කුලී පදනම මත ලබා ගන්නා බැකෝ ලෝඩරය ලබා නොගැනීමටත් නිර්දේශ කර තිබුණත් සමස්ත වර්ෂය පුරාම ලෝඩර් 2 බැගින් මාස 4 ක්ද, 3 හෝ 4 බැගින් මාස 8 ක්ද කුලී පදනම මත ලබා ගෙන ඒ සඳහා රු.81,096,604 ක් ගෙවා තිබුණි.

(iii) කොන්ත්‍රාත් කාළය අවසන් වුවද විධිමත් ටෙන්ඩර් පටිපාටියකින් තොරව 2015 ජුනි 30 දිනැති මහා සභා තීරණ අංක 2218 ප්‍රකාරව මුල් කොන්ත්‍රාත්කරු වෙතම ඉහත කාර්යය පවරා තිබුණි.

### 3.3.4 ලොරි රථය අළුත්වැඩියා කිරීම

------------------------------

සභාව සතු ලොරි රථයක් අළුත්වැඩියා කිරීම සඳහා රු.925,500 ක වැය ඇස්තමේන්තුවකට පෞද්ගලික ආයතනයකට ලබා දී තිබු අතර අපේක්ෂිත අළුත්වැඩියාවන් ලෙස සම්පූර්ණ එන්ජිම අළුත්වැඩියාව, තිරිංග පද්ධතිය අළුත්වැඩියා කිරීම, විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම, පැස්සුම් වැඩ, පින්තාරු, සහ PTO යන්ත්‍රය හා Hydraulic System අළුත්වැඩියා දක්වා තිබුණි. අළුත්වැඩියාවෙන් පසු ලොරි රථය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අංශය වෙත ලබා දී තිබුණි. 2016 මාර්තු 29 දින භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රථයෙහි පැස්සුම් වැඩ හා පින්තාරු සඳහා රු.290,000 ක මුදලක් සඳහා බිල්පත් නිකුත් කර තිබු නමුත් ලොරි රථය භෞතික පරීක්ෂාවේදි අදාල කාර්යය නියමිත පරිදි ඉටු කර නොතිබුණි.

(ii) ලොරි රථය වයරින් කිරීම සඳහා ඇස්තමේන්තු මුදල රු.45,000 ක් වු අතර භෞතික පරීක්ෂාවේදී ලොරි රථයේ ඩෑෂ් බෝඩ් තුල වු වයර් අපිළිවෙලට සවිකර තිබුණි.

### 3.3.5 විට්ස් වයික් ක්‍රීඩාංගනයෙන් තේක්ක දැව කපා ඉවත් කිරීම

------------------------------------------------------------

2014 මැයි සිට ජුනි දක්වා කාලය තුලදී විට්ස් වයික් ක්‍රීඩාංගනයෙන් කපා ඉවත් කර තිබූ රු.1,246,346 ක් වටිනා තේක්ක දැව කඳන් 50 ක් ඵලදායි කාර්යයකට යොදා නොගෙන මාස 18 ක කාලයක් අනාරක්ෂිත ලෙස සභාවට අයත් ස්ථානයක ගොඩගසා තිබූ බව 2014 නොවැම්බර් 14 දින කරන ලද පරීක්ෂාවේදී අනාවරණය විය.

### 3.3.6 වරිපනම් තක්සේරුව - විශේෂ පන්තියේ වෙළඳ ව්‍යාපාර

------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වරිපනම් අංක 578 දේපළ තක්සේරුවට අදාල පංච වාර්ෂික ප්‍රතිශෝධන 03 ක් පරීක්ෂාවේදී පහත සඳහන් සංඛ්‍යාත්මක අගයන් නිරීක්ෂණය විය.

| වර්ෂය | තක්සේරු ක්‍රමය | වාර්ෂික වටිනාකම | කාර්තුවක වරිපනම් බද්ද |
|---|---|---|---|
| 2004 | කොන්ත්‍රාත් ක්‍රමය | 38,500,000 | 3,368,750 |
| 2010 | ක්‍රමය ඉදිරිපත් නොවුණි | 40,600,000 | 3,552,500 |
| 2015 | ක්‍රමය ඉදිරිපත් නොවුණි | 44,660,000 | 3,907,750 |

* ඉහත අගයන්ට අනුව 2010 වර්ෂයේදී සිදු කර ඇති පංච වාර්ෂික වරිපනම් ප්‍රතිශෝධනයේදී පාදක කරගත් ක්‍රමවේදය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර 2015 වර්ෂයට අදාලව ඉදිරිපත් කර ඇති තොරතුරු පිළිගත හැකි මට්ටමේ ඒවා නොවීය. 2015 සිදුකළ පංච වාර්ෂික ප්‍රතිශෝධනයේදී, වරිපනම් තක්සේරුව රු.4,060,000 කින් වැඩි වී තිබූ අතර ඊට සමගාමීව කාර්තුවට අදාල වරිපනම් බද්ද රු.355,250 කින් ඉහළ යාම තහවුරු කිරීමට යොදාගත් තක්සේරු ක්‍රමය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) වරිපනම් අංක 578 දේපළ සම්බන්ධයෙන් 2004 පංච වාර්ෂික ප්‍රතිශෝධනයට අදාල තොරතුරු, ලිපිගොනුවේ ඇතුලත්ව තිබූ අතර එම තොරතුරු පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

* මෙම දේපළෙහි වාර්ෂික වටිනාකම තක්සේරු කිරීම සඳහා ලාභ ක්‍රමය හා කොන්ත්‍රාත් ක්‍රමය පදනම් කර ගනිමින් තක්සේරුකරුවකු විසින් වාර්ෂික වටිනාකම තක්සේරු කර තිබූ අතර එහිදී සත්‍ය වාර්ෂික වටිනාකම පිළිවෙලින් 88,000,000 සහ 73,000,000 ක් ලෙස තක්සේරු කර තිබුණි. මෙම වටිනාකම සම්බන්ධයෙන් සැහීමට පත් නොවීම මත වෙනත් තක්සේරුකරුවකු ලවා කොන්ත්‍රාත් පදනම මත තක්සේරු කිරීමේදී සත්‍ය වාර්ෂික වටිනාකම රු.95,616,750 ක් ලෙස තක්සේරු කර තිබුණි. මෙම සත්‍ය වාර්ෂික වටිනාකම කුලී වටිනාකම සමඟ සසඳා ඉන් සියයට 44.7 ක ප්‍රතිශතයක්, එනම් 42,750,000 ක් ලෙස වාර්ෂික වටිනාකම ගණනය කර තිබුණි. නාගරික තක්සේරුකරු රු42,500,000 ක තක්සේරුව අනුමත කර තිබුණ අතර විරෝධතාවය හේතුවෙන් රු.38,500,000 කට තක්සේරුව අඩු කර තිබුණි.
* ඉහත තක්සේරුකරුවන් විසින් කොන්ත්‍රාත් පදනම මත වටිනාකම තක්සේරු කිරීමේදී පදනම් කරගත් තොරතුරු අතර විශාල පරතරයක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | තක්සේරු - 1 | තක්සේරු - 2 | වෙනස | වෙනසේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ඉඩමේ පර්චස් 1ක වටිනාකම | 120,000 | 300,000 | 180,000 | 150 |
| ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය | 300,000 | 339,045 | 39,045 | 13 |

* ඉහත කරුණු අනුව වෘත්තිය තක්සේරුකරුවන්ගේ තක්සේරු කිරීම් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු වරිපනම් තක්සේරු කිරීමට අදාලව භාවිතා කළ බව තහවුරු නොවුණි. ඒ අනුව වරිපනම් තක්සේරු වල නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී සැහීමට පත් නොහැකි විය.

(iii) දේපළ තක්සේරු ලිපිගොනු පවත්වාගෙන යාමේදී පංච වාර්ෂික ප්‍රතිශෝධනයන් වලදී, යොදා ගන්නා තක්සේරු ගණනය කිරීම් වලට අදාල තොරතුරු ලිපිගොනු වල යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) ප්‍රතිශෝධනය පංච වාර්ෂිකව සිදුකල යුතු වුවත්, එය වසර 06 සිට වසර 40 දක්වා ප්‍රමාද වූ අවස්ථා නිරීක්ෂණය විය.

(iv) සභා බල ප්‍රදේශය තුළ ඌන සංවර්ධන ආදායම් කොට්ඨාශ ලෙස නාරාහේන්පිට, කිරුළ, කිරුළපන හා පාමංකඩ නැගෙනහිර කොට්ඨාශ 4 ට අදාලව වරිපනම් තක්සේරු දේපළ 17,231 ක් හඳුනාගෙන තිබුණි. වර්ෂ 50 කට පෙර සිට ඌන සංවර්ධිත ප්‍රදේශ ලෙස

හඳුනාගත් එම කොට්ඨාශ සභාව විසින් සංවර්ධනය කිරීමට සුදුසු පියවර මේ වනතෙක් නොගැනීම හේතුවෙන් වරිපනම් බදු අය කිරීම සියයට 15 මට්ටමේ පවතින අතර එය වර්ධනය කර ගැනීමට සභාව කටයුතු නොකිරීම නිසා වාර්ෂිකව සභාවට සැලකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

**3.3.7 අනවසර ඉදිකිරීම්**

-------------------

සභා බල ප්‍රදේශයට අයත් කලාප 47 ක් තුළ අනවසර ඉදිකිරීම් 1982 ක ප්‍රමාණයක් 2014 වර්ෂය වන විට හඳුනාගෙන තිබූ අතර එම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග වාර්තා නොවිය.

**3.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

--------------------------------

**(අ) ආර්.එල් ද මෙල් මාවතේ පිහිටි වරිපනම් අංක 105 දරන ඉඩම**

--------------------------------------------------------------

(i) බෞද්ධ ආගමික කටයුත්තක් සඳහා 99 අවුරුදු බදු ගිවිසුමක් මත 1983 සැප්තැම්බර් 04 දින වසරකට රු.1,200 බැගින් බදු දී තිබූ රූඩ් 2 පර්චස් 19 ක් වූ මෙම ඉඩම බදුකරු විසින් සභාවේ අනුමැතියක් රහිතව 1994 ජනවාරි 11 දින අතුරු බදු දී තිබූ අතර ඉන් පසු වසර 21 කට ආසන්න කාලයක් අතුරු බදුකරු දේපළ භුක්ති විඳිමින් තිබුණි. 2016 මැයි 30 වන විටත් අදාල අතුරු බදුකරු මෙම දේපළ භුක්ති විඳින බව නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි.

(ii) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දීම මගින් සිදුවූ නිතියට පටහැනි ක්‍රියාවලින් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරීක්ෂණයන් මේ වන විටත් සිදුව නොතිබුණි.

(iii) නීත්‍යානුකූල පැවරීමකින් තොරව උප බදුකරු විසින් පරිහරණය කරන ඉහත දේපළ සම්බන්ධයෙන් නියමිත වරිපනම් ගෙවීම් පැහැරහැර තිබූ අතර 2012 සිට 2015 දක්වා පසුගිය වසර 04 ට අදාලව රු.1,170,637 ක වරිපනම් අයවිය යුතුව තිබුණි.

**(ආ) ව්‍යාජ තොරතුරු මත දේපළවල අයිතිය මාරු කිරීම.**

---------------------------------------------------

වරිපනම් කොට්ඨාශ අංක 32, කුප්පියා වත්ත, බටහිර ප්‍රදේශයේ, මරදාන පාර අංක 680 දරන ස්ථානයේ පර්චස් 34.35 ක දේපලෙහි අයිතිය 1958 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයිතිව තිබුණු අතර පෞද්ගලික අයිතිකරුවකුගේ නම වරිපනම් ලේඛනයේ ව්‍යාජ ලෙස ඇතුලත් කිරීම මගින් එම පෞද්ගලික අයිතිකරු වෙත ව්‍යාජ හිමිකමක් ලබා දීමට සැලසුම් සහගතව ක්‍රියාකර තිබුණු බව විගණනය විසින් වාර්තා කිරීමෙන් පසු පෙර අයිතිකරුගේ නම වරිපනම් ලේඛනයට ඇතුලත්කර තිබුණි. අයිතිය මාරු කිරීම සම්බන්ධ සියළු ලේඛන අස්ථානගතකර තිබුණු අතර, සිද්ධියට සම්බන්ධ පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.5 ආර්ථික නොවූ ගණුදෙනු**

-----------------------

**හෙන්රි පේද්රිස් ක්‍රීඩාංගනය බදු දීම**

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) රූඩ් 02 පර්චස් 12.15 ක පැසිපන්දු ක්‍රීඩාපිටිය තරුණයාට හෙටක් සංවිධානය වෙත 2012 ජනවාරි 16 වන දින සිට 2032 වර්ෂයේ ජනවාරි 15 දින දක්වා වසර 20 ක අදාල කාලයකට බදු දී තිබුණි. කොළඹ නගර වැසියන්ගේ ක්‍රීඩා කටයුතු වැඩි දියුණු කිරීම හෝ සභාවේ ආදායම වර්ධනය කිරීම පිළිබඳ සැලකිල්ලක් නොදක්වා විවෘත වෙළඳ පළේ මිල කැඳවීමක්

සිදු නොකර ඉහතකී සංවිධානයේ ඉල්ලීම පමණක් සැලකිල්ලට ගෙන ක්‍රීඩාංගනය බදු දීමට කටයුතු කර තිබුණි.

(ii) මෙම දේපල බදු දීම සඳහා නාගරික තක්සේරුකරුගේ වාර්තාව අනුව මාසික බදු කුලිය රු.300,000 ක් බව තීරණය කර තිබුණි. 2011 සැප්තැම්බර් 27 දිනැති අංක 2227 දරන සභා තීරනයෙන් බදු කුලිය රු.115,000 ක් දක්වා අඩු කර තිබූ අතර එම අඩු කිරීම හේතුකොටගෙන 2015 දෙසැම්බර් 31 දිනට සභා අරමුදලට අහිමි වූ ආදායම රු.8,510,000 ක් විය.

(iii) ගිවිසුමේ (III) ඡේදය ප්‍රකාර රු.මි. 20 ක මුදලක් ක්‍රීඩාංගනය නවීකරණය කිරීම සඳහා බදුකරු විසින් අයෝජනයක් සිදු කළ යුතු බව දක්වා ඇතත් එම අයෝජනය සිදුකල යුතු අකාරය සහ අදාල කාලවකවානු දක්වා නොතිබීමෙන් එම අයෝජනය ඵලදායි වූයේද යන්න පරීක්ෂා කළ නොහැකි විය. තවද බදු කාල සීමාව තුල ගොඩනැගිලි ඉදිකරන බව දක්වා ඇතත් එම ඉදිකරනු ලබන ගොඩනැගිලි සැලැස්ම සහ අදාල ගොඩනැගිලි ඉදිකරන ආකාරය සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු ගිවිසුමට එළඹීමට පෙර ලබාගත යුතු වුවත් එවැනි ප්‍රමාණවත් තොරතුරු කිසිවක් ලබාගෙන නොතිබුණි.

## 3.6 හඳුනාගත් අලාභ

----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ජල සම්පාදන ජල ප්‍රවාහන අංශයේ සේවයේ නියුතු අනියම් සේවකයින් වෙනුවෙන් 1997 දෙසැම්බර් සිට 2014 ජනවාරි දක්වා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් ප්‍රමාදවීම් මත රු.182,064 ක අධිභාරයක් හා සේවක අර්ථසාධක අරමුදලට 2000 ජුනි සිට 2014 පෙබරවාරි දක්වාගෙවිය යුතු දායක මුදල් ප්‍රමාදවීම් මත රු. 963,274 ක අධිභාරයක් ගෙවීමට තිබූ අතර කළමනාකරණ අකාර්යක්ෂමතාවය හේතුවෙන් ගෙවීමට සිදුවූ රු.1,145,338 ක අධිභාර මුදල සභාවට සිදුවූ පාඩුවක් විය.

(ආ) 2015 වර්ෂයේදි ගෙවා තිබූ මැතිවරණ රාජකාරී දීමනා රු.116,974 ක් නියමිත දිනට ප්‍රථම මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණයකර නොගැනීම නිසා එම මුදල සභාවට වූ පාඩුවක් විය.

## 3.7 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

**කසළ තුල අඩංගු ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය**

------------------------------------------------------------

2014 වර්ෂයේදී ව්‍යාපෘති වාර්තා සකස්කර එම වර්ෂයේම ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයක්ද තෝරාගෙන තිබූ නමුත් 2015 දෙසැම්බර් 31 වන විටත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2006 අප්‍රේල් මාසයේදී අක්කර එකකට ආසන්න ඉඩමක් තෝරාගෙන තිබුණද මෙම ඉඩම මහජන නියෝජිතයන් විසින් ඉදිරිපත් කල නිවාස ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට තීරණය කර තිබුණි. කොළඹ නගරයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය හා මීතොටමුල්ල කසළ බැහැර කිරීමේ මධ්‍යස්ථානය පිළිබඳව පාරිසරික ගැටළුමතු වීම නිසා නිරන්තරයෙන් මහජන කැළඹීම් උද්ගතවීම මත මෙම ගැටළුවට විසඳුම් සෙවීමට ප්‍රමාද කිරීම සාධාරණ තත්ත්වයක් නොවීය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්/වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් සියයට 50 කටත් වඩා ඉතිරි වී තිබූ වැය විෂයන් 786 ක් නිරීක්ෂණය වූ අතර ඉන් දෙපාර්තමේන්තු 22 ක වැය විෂයන් 397 ක් සඳහා සලසා තිබූ රු.1,426,184,980 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු 20 ක වැය විෂයන් 175 ක් සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් වෙන්කර තිබූ ප්‍රතිපාදන වලට අමතරව සියයට 50 කටත් වඩා වැඩි ප්‍රමානයක ප්‍රතිපාදන වෙනත් වැය විෂයන් තුලින් මාරුකර ගෙන තිබුණි. මෙසේ වෙනත් වැය විෂයන් තුලින් මාරුකරගෙන තිබූ අතිරේක ප්‍රතිපාදන වල ප්‍රතිශතය සියයට 50 සිට 17900 දක්වා වූ පරාසයක පැවතුණි.

### 4.2 වත්කම් කළමනාකරණය

-----------------------

**නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) අනුජීව රසායනාගාරය සඳහා 2015 සැප්තැම්බර් 14 දින මිලදී ගෙන තිබුණු රු.285,000 ක් වටිනා ECG උපකරණ 3 ක් 2016 මාර්තු 24 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ii) Sky Lift රථය 2007 අප්‍රේල් මස සිට ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්ව ඇති බැවින් ගිනි නිවන අංශයේ පුහුණු අංගනය වෙත භාරදී තිබුණි.

(iii) රු.2,172,744 ක මුදලක් වැය කර 2012 වර්ෂයේදී අළුත්වැඩියා කර තිබූ සභාව සතු ලැන්ඩ් ලොවර් රථය මේ වන විට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගාල් කර තිබුණි.

(iv) හදිසි අනතුරක් හේතුවෙන් අළුත්වැඩියා සඳහා යොමුකළ ට්‍රැක්ටර්රථයක් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ ගරාජය තුළ ගාල් කර තිබූ අතර 2011 ජුනි 01 දින රු.99,800 ක අළුත්වැඩියා ඇස්තමේන්තුවක්ද ලබා දී තිබුණි. 2016 අප්‍රේල් 05 වන දින වන විටත් මෙම ට්‍රැක්ටර්රථය අළුත්වැඩියා කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(v) ධාවනයෙන් ඉවත් නළ සභාව සතු ඩෝසරයක් අළුත්වැඩියා සිදුකර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබූ අතර භාවිතයට ගත නොහැකි තත්ත්වයේ වාහන 30 ක් කර්මාන්තශාලා පරිශ්‍රය තුළ රඳවා තිබුණි.

### 4.3 නොවිසඳි ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

--------------------------------------------------------

2014 වර්ෂයේදී නිකුත් කරන ලද රු.4,991,542 ක ගනුදෙණු වලට අදාල විගණන විමසුමකට 2016 සැප්තැම්බර් 30 දින වන විටත් පිළිතුරු ලැබී නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ

(අ) ගිණුම්කරණය

(අ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඉ) ණය අපද්‍රව්‍ය කළමනාකරණය